# නාථ දේව සංකල්පය : ප්‍රභවය හා විකාශය පිළිබඳ සමාජ, ඓතිහාසික විවරණයක්

තල්වත්ත, ටී. පී. ඒ.

මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,

ajiththalwatte@gmail.com

මෙම පර්යේෂණය නාථ දේව සංකල්පය ප්‍රභවය හා විකාශය පිළිබඳ සමාජ, ඓතිහාසික විවරණයක් යන මාතෘකාව මත පදනම් ව සිදුකෙරෙන අධ්‍යයනයක් වශයෙන් සඳහන් කළ හැකි ය. ක්‍රි.පූ. 3 වන සියවසේ සිදු වූ මහින්දාගමනයත් සම!ග බෞද්ධ සංස්කෘතිය ථෙරවාදී බුදුදහම මත පෝෂණය වූ බව පෙනේ. නමුත් පසුකාලීන ව මෙරට මහායාන තාන්ත්‍රික සම්ප්‍රදාය සහ බෝධිසත්ව ඇදහීම පිළිබඳ අදහස් ද ප්‍රචලිත වේ. එම අදහස් හා සම්මිශ්‍ර ව අවලෝකිතේශ්වර වන්දනය ද සමාජයෙහි ජනප්‍රියත්වයට පත්විය.

ක්‍රි.ව. 8-9 සියවස්වල අභයගිරි තුළ සංඝ පිළිබඳ විවෘත මතය වඩා ප්‍රකටවී යාමත්, මහා විහාර ස්ථවිරවාදීන් වෙත තිබූ රාජ්‍ය බලය ක්‍රමයෙන් ලිහිල්වී යාමත් සිදුවූ පෙනේ. ඒ සම!ග ම මහායානික අදහස් වඩාත් ජනප්‍රියභාවයට පත් වේ. මෙරට අවලෝකිතේශ්වර හා නාථ ඇදහීමේ විශේෂ ලක්ෂණය වූයේ එය සංඝ සමාජය නොව ගිහි සමාජය තුළ ජනප්‍රිය වීමයි. එබැවින් වර්ධනය වෙමින් පැවති අවලෝකිතේශ්වර භක්තිය විවිධ මට්ටම්වල ගිහි පිරිස්, වඩා විවෘත අදහස් තිබූ භික්ෂූන් වහන්සේ ඇතු!ළු පු!ළුල් සමාජයක් කෙරෙහි විෂය වන්නට විය. ක්‍රි.ව. 7 -8 සියවස්වල ආගමික සංස්කෘතිය මගින් අවලෝකිතේශ්වර පිළිගැනෙන අවස්ථාවේ පටන් මෑත යුගයේ දී නාථ දෙවියන් වශයෙන් පිළිගැනීම ද් ඉතා වැදගත් අවස්ථාවකි. අස්ගිරි විහාර ලිපියේ මෙම දෙවියන් ලෝකේශ්වරනාථ නමින් දැක්වෙයි. පසු කලක මුල් කොටස අභාවයට ගොස් නාථ යන නම පමණක් ඉතිරි වේ. නාථ යන සංකල්පයේ අදහස වන්නේ පිහිට, ආරක්ෂාව හෝ ස්වාමීන්වහන්සේ යනුවෙනි. අනාගතයේ බුදුවන මෛත්‍රිය බෝධිසත්වයන් මෙම නාථ නමින් හැඳින් වූ බව පෙනේ.

නාථ දේව සංකල්පය: ප්‍රභවය හා විකාශනය පිළිබඳ සමාජ ඓතිහාසික විවරණයක් යන පර්යේෂනයේ අරමුණ වන්නේ නාථ දේව සංකල්පයේ ප්‍රභවය හඳුනාගෙන එහි සමාජ හා ඓතිහාසික වැදගත්කම ගවේෂණය කිරීමයි. 7-8 සියවස්වල දී මෙරට ප්‍රචලිත වූ අවලෝකිතේශ්වර නාථ ඇදහීම නාථ දෙවියන් බවට පත්වූයේ කෙසේ ද යන්න හඳුනාගෙන මහනුවර යුගයේ දී නාථ දෙවියන් හා සබැඳි සමාජ විද්‍යාත්මක පරිසරය අධ්‍යයනය කිරීමට අපේක්ෂිත ය. ප්‍රධාන වශයෙන් මහනුවර පිහිටි මහනුවර නාථ දේවාලයේ පූජා චාරිත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමට අපේක්ෂිත ය.

මෙම අධ්‍යයනයේ පර්යේෂණ ක්‍රමවේදනය ද ඉතා වැදගත් වේ. ප්‍රාථමික මූලාශ්‍ර සහ ද්විතියික මූලාශ්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කර ජනශ්‍රැති හා ක්ෂෙත්‍ර අධ්‍යයන ද භාවිත කිරීමට නියමිත ය.

ප්‍රධාන වශයෙන් මෙම දේව සංකල්පය හා සමාජ ඓතිහාසික වැදගත්ක ම පිළිබඳ සිදුකර ඇති අධ්‍යයනයන් එතරම් ප්‍රමාණවත් නොවන බව පෙනේ. සෙනරත් පරණවිතාන සහ ජෝන් ක්ලිෆර්ඩ් හෝල්ට් යන අය පර්යේෂණ සිදුකර ඇත්තේ වෙනත් ක්ෂේත්‍ර ඔස්සේ ය. දේව වන්දනය විවිධ වෙනස්කම්වලට ලක්වන නූතනයෙහි නාථ දෙවිඳුන් වන්දනය ජනප්‍රිය බුදුදහම තුළ අලුත් වුවක් නොවේ. සංකල්පීය වශයෙන් උක්ත දෙවියන් බුදුවරයෙකුට සමාන කර දැක්වීම ජනශ්‍රැතිය ම!ගින් ගැඹුරින් විමසීමට ලක්කළ යුතු ය. අනෙක් අතට ජනප්‍රිය දේව වන්දනයෙහි එන නාථ දෙවියන් පිළිබඳ වන්දනය වෙනස්වී පෙනෙන්නේ ඇයි ද යන්න විමසීමත් වැදගත් වේ. දෙවනු ව ලාංකීය දේව වන්දනයට මහායානික බලපෑම මගින් සිහිපත් කෙරෙන එක්තරා සංකේතයක් ලෙස නාථ දෙවියන්ගේ ප්‍රතිරූපය කැපී පෙනේ.

නාථ වන්දයේ මුඛ්‍ය පරමාර්ථය වූයේ ලෞකික මෙන් ම ලෝකෝත්තර අරමුණ සාක්ෂාත් කර ගැනීමයි. මෙනිසා ථෙරවාදය තුළ මෙන් ම මහායානය තුළ නාථ දෙවියන් වැදගත් විය. ක්‍රමික විකාශනයක ප්‍රතිඵලයක් වූ නාථ දෙවියන් මහනුවර යුගයේ දී වඩාත් සුවිශේෂී වේ. ඊට හේතු වන්නේ විරපරාක්‍රම නරෙන්ද්‍ර සිංහයන් අවසන් වූ සිංහල රාජ පරපුර යළි ආරම්භ වන්නේ නායක්කාර වරුන්ගෙනි. මෙනිසා ථෙරවාදී බෞද්ධ යළි ස්ථාපිත වන්නේ මෙතැන් සිටය. උඩරට රාජ්‍යයේ බොහෝ කටයුතු නාථ දෙවියන් හා සම්බන්ධ වීම වඩාත් වර්ධනීය අවස්ථාවක් වීම ද කැපී පෙනේ. ක්‍රි.ව. 1815 දී බ්‍රිතාන්‍යය ආධිපත්‍යයට නතුවීමෙන් පසු ආක්‍රමණශීලී නවීනත්වය බුදු දහම වෙත එල්ල විය. නාථ සංකල්පය මෛත්‍රී බෝධිසත්ව සංකල්පයට මුසුවී නූතන බෞද්ධ සමාජය තුළ පු!ළුල් කථිකාවතකට බඳුන් වීම විශේෂ අවස්ථාවකි.

***ප්‍රමුඛ පද*** *: ශ්‍රී ලංකාවේ දේව සංකල්ප, මහායනාය, අවලෝකේතිශ්වර බෝධිසත්ව, නාථ දේවාල .*